හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (I) | 2016 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු මුද්දර ගාස්තු රු.392,780 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (II) | සමාලෝචිත වර්ෂය සඳහා වූ උසාවි දඩ ආදායම රු.97,956 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (III) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.79,069 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් 02 ක ශේෂයන් හා එම ගිණුම්වලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ අතර රු. 802,292 ක වෙනසක් විය. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ණයගැති ලේඛණ, ණයහිමි ලේඛණ,අත්තිකාරම් ලේඛණ, තැන්පත් ලේඛණ සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා යනාදි තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා රු.36,584,055 ක්වූ ගිනුම් ශේෂ 13ක් විගණනයේදි සතුටුදායක් ලෙස සත්නිරික්ෂණය කිරීමට නොහැකි විය. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලේඛණ සහ වාර්තා ඉදිරිපත් කළයුතු වේ. | ශේෂ ලැයිස්තුව සකස්කර ලබාදෙන අතර 2017 ට පෙර පවතින ශේෂයන් සොයා නිවැරදි කිරීමට පියවර ගනිමි. |

(ඈ) ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

(I) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.23,585,221 ක් වූ අතර, ඉන් රු.15,859,439 ක් වසරක කාලයක් ඉක්මවා අයනොවී පැවතුනි. | ලැබිය යුතු ශේෂ අයකරගැනීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(II) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,383,868 ක් ගෙවිය යුතු ගිණුම් ශේෂ දෙකක් වසර 01 ක කාලයක් ඉක්මවා තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

--------------------

නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

| | නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2019 මාර්තු 04 දින වන විටද ආරම්භකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණය සිදුකරමින් පවති. |
| (ආ) | මුදල් රෙගුලාසි 1646 | සභාව සතු කැබ් රථයක සඳහා සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් මාසය දක්වා ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ධාවන සටහන් ඉදිරියේදී ඉදිරිපත් කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,517,554 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,015,791 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

(අ) ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,653,600 | 2,867,853 | 1,170,580 | 2,281,153 | 4,896,800 | 2,703,632 | 1,031,599 | 2,368,977 |
| කුලී | 5,232,000 | 3,514,595 | 2,865,909 | 2,496,322 | 6,123,900 | 4,778,602 | 2,672,314 | 2,365,402 |
| බලපත්‍ර ගාස්තු | 2,638,000 | 2,222,141 | 2,222,141 | - | 2,633,100 | 2,546,313 | 2,546,313 | - |
| වෙනත් ආදායම් | 14,336,800 | 12,574,779 | 5,778,730 | 7,155,791 | 9,350,000 | 10,057,110 | 5,870,431 | 6,088,369 |
| | 24,860,400 | 21,179,368 | 12,037,360 | 11,933,266 | 23,003,800 | 20,085,657 | 12,120,657 | 10,822,748 |

### 2.2.1 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හඟුරන්කෙත පොදු වෙළඳපල සංකීර්ණයේ කඩ කාමර 12කින් වසර 04 සිට 08 දක්වා කාලයක් පැවත එන රු.2,130,712 ක හිඟ කඩ කුලී අයකරගෙන නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිඟ මුදල් අයකරගත යුතු වේ. | නීතිමය කටයුතු සිදුකර හිඟ ආදායම් ආයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.1,119,993 ක් හා මුද්දර ගාස්තු රු.4,389,750 ක් අයකර නොතිබුණි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්ය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ සහකාර සේවයට අයත් මුදල් අයකැමි තනතුරේ රාජකාරී ඉටුකිරීම2018.03.26 දින සිට විදුලි කාර්මික නිළධාරියාට පවරා තිබුණි. | මෙම කාර්ය සඳහා අදාළ නිලධාරියෙක් යෙදවිය යුතුවේ. | 2019.06.01 දින සිට මෙම තනතුර සඳහා කළමනාකරණ සහකාර නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1. අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී ඇති වෙනස්වීම් සඳහා කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව වෙනස්වීම් පිළිබව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට මෙය ක්‍රියාත්මක කරන බව දන්වමි. |